**මොණරාගල, බුත්තල ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය - 2014**

-----------------------------------------------------------------------------------

මොණරාගල, බුත්තල ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා බෙල්ජියමේ කේබීසී බැන්ක් එන් වී අතර 2014 ජුනි 16 දින එළඹි ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මොණරාගල හා බුත්තල නගරවල සහ අර්ධ නාගරික ප්‍රදේශවල ගෘහ පාරිභෝගිකයින් සහ වාණිජ හා කාර්මික ක්ෂේත්‍රවල පාරිභෝගිකයින් 50,000 කට වැඩිදියුණු කළ ජලය සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපාතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 5,545.48 කට සමාන යූරෝ මිලියන 31.41 ක් වේ. ඉන් රු.මිලියන 2,291.76 කට සමාන යූරෝ මිලියන 13 ක් ණය මුදලක් වශයෙන් ලබාදීමට කේබීසී බැන්ක් එන් වී එකඟ වී ඇති අතර රු.මිලියන 353.27 කට සමාන යූරෝ මිලියන 02 ක මුදලක් බෙල්ජියම් එක්ස්පෝට් පෝෂන් යටතේ ප්‍රදානයක් ලෙස ලබා දෙනු ඇත. තවද, රු.මිලියන 1,590.45 කට සමාන යූරෝ මිලියන 8.98 ක් ලබාදීමට හැටන් නැෂනල් බැංකුව එකඟ වී ඇත. ව්‍යාපෘතියේ කටයුතු 2014 දෙසැම්බර් 30 දින ආරම්භ වි 2017 ජුනි 30 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය

ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(ඌ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන චක්‍රලේඛය අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2017 අගෝස්තු 30 දින වේ.

### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මහ පෙන්වීම් 8.9.3 වගන්තිය අනුව රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් ව්‍යාපෘතියේ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ යුතුව තිබුණි. කෙසේ වුවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපති විසින් ව්‍යාපෘතියේ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර තිබුණි.

(ආ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6(1) (අ) වගන්තිය අනුව හා 2006 ප්‍රසම්පාදන මහ පෙන්වීම්හි 13 වන සංශෝධනය අනුව රු.මිලියන 5 ක් හෝ ඊට වැඩි කොන්ත්‍රාත් භාරගන්නා කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතුයි. තවද, ටෙන්ඩරය පිරිනැමීමෙන් පසුව දින 60 ක් ඇතුළත කොන්ත්‍රාත් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කල යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කාර්යයන්වල යෙදී ඇති කොන්ත්‍රාත්කරු මෙම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

### 2.2.3 සැසඳීම් නොකළ ශේෂයන්

ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කරගෙන යන වැඩවල වටිනාකම වූ රු.මිලියන 4.24 ක මුදල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල අදාල කරගෙන යන වැඩ ලෙස පෙන්වා තිබූ රු.මිලියන 4.74 සමඟ එකඟ වී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණයගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | 2014 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| ----------- | -------------------------- | | ------------------------- | ---------------------------- | |
| | යූරෝ මිලියන | රු.මිලියන | රු.මිලියන | යූරෝ මිලියන | රු.මිලියන |
| **කේබීසී ණය** | 13.00 | 2,291.76 | | | |
| **ප්‍රදාන** | 2.00 | 353.27 | 550 | 2.99 | 478.04 |
| **එච්එන්බී** | 8.98 | 1,590.45 | - | 1.81 | 286.18 |
| ශ්‍රී ලං.ර | 7.43 | 1,310.00 | - | 0.03 | 4.23 |
| | -------- | ------------ | ------- | ------ | ------- |
| **එකතුව** | **31.41** | **5,545.48** | **550** | **4.83** | **768.45** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දේශීය හා විදේශීය නියෝජිත ආයතන මගින් ලබාගත් ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර උප ණය ගිවිසුමක් අත්සන් කර නොමැති බව නිරීක්ෂණය විය. මේ නිසා, සමාලෝචිත වර්ෂය තුල ලැබුණු සමුච්චිත මුදල වන රු.මිලියන 764.24 මූල්‍ය ප්‍රකාශන වල ණය මුදල් ලැබීම් රු.මිලියන 114.64 ක් වශයෙන් හා ප්‍රදාන ලැබීම් රු.මිලියන 649.61 ක් වශයෙන් වැරදියට බෙදා වෙන් කර දක්වා තිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන වාර්තා අනුව සමාලෝචිත වර්ෂය තුල ණය මුදල් වශයෙන් රු.මිලියන 482.25 ක්ද, ප්‍රදාන වශයෙන් රු.මිලියන 291.22 ක්ද ලැබී තිබුණි

(ආ) වෙන්කරන ලද මුදල් උපයෝගී කර ගනිමින්, නියමිත කාලපරිච්ඡේදය තුල ව්‍යාපෘතියේ අරමුණු ලඟා කර ගැනීම සහතික කරනු පිණිස ව්‍යාපෘතියේ සම්පූර්ණ කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි, මාසික, කාර්තු හා අර්ධ වාර්ෂිකව මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඉස්මතුවන පරිදි වගකීම් පවරන ලද සම්පූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුව තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය විසින් එවැනි සැලසුමක් පිළියෙල කර ක්‍රියාවට නංවා නොතිබුණි.

(ඇ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2011 වර්ෂයේ සකස්කරන ලද රු.මිලියන 3,100.50 කට සමාන යූරෝ මිලියන 20.67 ක්වූ සිවිල් කාර්යයන් සඳහා වන ඉංජිනේරු ඇස්තමේන්තු පසුව රු.මිලියන 2,950.50 කට සමාන යූරෝ මිලියන 19.67 ක් ලෙස සංශෝධනය කර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, කොන්ත්‍රාත්තුව රු.මිලියන 3,597 කට සමාන යූරෝ මිලියන 23.98 කට ප්‍රදානය කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

**------------------**

**පහත කරුණු නිරීක්ෂණය විය**

(අ) රජයේ ප්‍රසම්පාදන මහපෙන්වීම් 23 වන අතිරේකයෙහි 3.3 වගන්තිය අනුව විශේෂ ඉල්ලීමක් රහිත (unsolicited)කොන්ත්‍රාත්තුවක ණය ආපසු ගෙවීම් පිළිබඳ මූල්‍ය කොන්දේසිය වනුයේ වර්ෂ 03 ක සහන කාලයක් සහිතව අවම වශයෙන් වර්ෂ 15 ක කාලසීමාවක් වේ. කෙසේ වුවද, මාස 06ක සහන කාලයක් සහිතව වර්ෂ 03½ ක කාලයකින් කාර්යයන් කරගෙනයාමට විශේෂ ඉල්ලීමක් රහිතව (unsolicited) කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුලත්වීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ ලියවිලි අනුව සමාලෝචිත වර්ෂය තුල තුළුමුව සහ බුත්තල භූගත ජලාශයේ ඉදිකිරීම් කටයුතු, ආයතන හා පරිපාලන ගොඩනැගිලි, නිලධාරී නිල නිවාස ඉදිකිරීම හා බෙදාහැරීම් සඳහා ජලනල එලීම වැනි කාර්යයන් සමාලෝචිත වර්ෂය තුල ආරම්භ කිරිමට අවශ්‍ය වී තිබුණද, අදාල කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවෙකු මේ සඳහා තෝරා ගෙන තිබුණද, 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම කාර්යයන් ආරම්භ කර නොතිබුණි.

**3.3 මූල්‍ය පාලන දුර්වලතා**

**----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 626 අනුව සෑම ව්‍යාපෘතියක් සඳහාම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට වෙනම ගිණුම් වාර්තා ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යා යුතුයි. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවෙමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ප්‍රධාන මුදල් පොත ව්‍යාපෘතියේ ලැබීම් හා ගෙවීම් සටහන් කිරීමට ද භාවිතා කර තිබුණි.

(ආ) 1988 දෙසැම්බර් 31 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව ව්‍යාපෘතිය ස්ථාවර වත්කම් ලේඛනයක් ක්‍රමවත් ලෙස පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඇ) 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 133 අනුව ව්‍යාපෘතියේ කාර්යයන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි.